# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 10 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය I **කාලය :** පැය 1

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

- **අංක 01 සිට 04 ප්‍රශ්නවල එක් එක් වාක්‍යයන්හි ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.**

1. අපි ලෝක කුසලාන දිනූ ශ්‍රී ලාංකික ක්‍රීඩකයා මහත් **හරසරින්** පිළිගත්තෙමු.
   1. ඉතා කැමැත්තෙන් 2. මානව දයාවෙන්
   3. ඉතා ඉහළින් 4. ඉතා ආදරයෙන්

2. හදිසියේ ඇතිවූ ගංවතුර තර්ජනයට මුහුණ දුන් ගම්වාසීන් විශාල පිරිසකට **උන්හිටිතැන්** අහිමි විය.
   1. දේපළ 2. වාසස්ථාන 3. නවාතැන් 4. වස්තුව

3. ''හිතේ කහටක් තියාගෙන නම් අපේ ගෙදර එන්න එපා'' යි අත්තම්මා **චෝදනා මුඛයෙන්** පැවසුවාය.
   1. කරදරයක් 2. චෝදනාවක් 3. අමනාපයක් 4. පසුතැවිල්ලක්

4. අනතුර ගැන ඇසූවිට තමාට **ගිනිපත්තු** වූ බව මුරකරු කී ය.
   1. බියට පත් වූ 2. කරදරයට පත් වූ 3. අසහනයට පත් වූ 4. ලැජ්ජාවට පත් වූ

- **අංක 05 සිට 08 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.**

5. ..................... යනු තමා විඳින අත්දැකීම් ඇසුරෙන් අපූර්ව වස්තු නිර්මාණය කරගැනීමේ හැකියාවයි.
   1. ප්‍රතිභාව 2. අනුප්‍රාසය 3. සතතාභ්‍යාසය 4. ඖචිත්‍යය

6. ග්‍රාමීය ප්‍රදේශයන්හි දක්ෂ දරුවන්ට සමාජයේ ඉහළ ස්තරවලට ..................... වීමේ හිණිපෙත වූයේ මධ්‍ය මහා විද්‍යාලයයි.
   1. ආකර්ෂණය 2. සංවේදී 3. සම්ප්‍රාප්ත 4. කාර්යක්ෂම

7. සාර්ථක කෙටි කතාවක් නිර්මාණය කිරීම ..................... කළ හැකි දෙයක් නොවේ.
   1. සංකේතාත්මකව 2. පරිශීලනයෙන් 3. ආකස්මිකව 4. වින්‍යාසයකින්

8. රාජ සභාවෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් දූනටමත් තම කීර්තිය හා බලය සහිත තනතුරු අත්හැර දමා තවුස්දම් පිරීමේ ..................... පළ කොට ඇත.
   1. අභිප්‍රේරණය 2. අභිරුචිය 3. අභිලාෂය 4. අභියෝගය

9. අකාරාදී පිළිවෙළට යෙදී ඇති පිළිතුර තෝරන්න.
   1. සුනේත්‍රා, සක්වා ලිහිණි, සිංහබාහු, සුබ සහ යස
   2. මයුර, පරෙවි, සැළලිහිණි, හංස
   3. ආවර්ජනා, රතුරෝස, බෝඩිම, වස්සානේ
   4. අමාවතුර, පූජාවලිය, බුත්සරණ, වෙසතුරු දාකව

10. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වාක්‍යය තෝරන්න.
    1. සාහිත්‍යය නිර්මාණය කිසියම් වින්දනයක් ආශ්වාදයක් රසයක් තිබිය යුතුය.
    2. භාෂාවේ විවිධ ස්වරූප සුසංයෝජනය කරගනිමින් කාව්‍යෝක්ති නිර්මාණය කරයි.
    3. කවියා ව්‍යංගාර්ථවලින් පරිපෝෂිත වාංමාලාවක් යොදා ගනියි.
    4. නිර්මාණකරුවා අවස්තෝචිත පරිදි වියත් වහර කට වහර යොදා ගනියි.

11. පහත දැක්වෙන පද අතුරෙන් මහාප්‍රාණ අක්ෂරයක් නොයෙදුණු පදයක් ඇතුළත් වරණය තෝරන්න.
1. භාෂණ, සර්ෂණ, සාධන, නිෂ්ප්‍රභ
2. කනිෂ්ඨ, පාඨ, ඖෂධ, භක්තිය
3. ආභාසය, ශිෂ්ටාචාරය, නිෂ්ඵල, ධාරිතා
4. අධ්‍යක්ෂ, ඡේදනය, අභ්‍යාස, කොට්ඨාස

12. පහත දැක්වෙන පද දෙකෙහි ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන්කළ විට නිවැරදිව දැක්වෙන වරණය වන්නේ
1. බලු + ආ , වඳුරු + ආ
2. බල + මින් , පුත්තු + ආ
3. දරු + ඕ, කර + නු
4. පොත් + වලින්, යහපත + අ

13. විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ,
1. සිරිත් විරිත්
2. අවුල් වියවුල්
3. ආගන්තුක නේවාසික
4. සුසිල් දුසිල්

14. කළගෙඩි බිඳ **ගොස්** තම ගෙට වැදුණි.
පුන නූල ඇද **දමමින්** බිඳලා
1. අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
2. විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා
4. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

15. පහත දැක්වෙන උද්ධෘත ඇතුළත් කෘති පිළිවෙළින් දී ඇති වරණය වන්නේ,
- ''අර ඉන්නේ එයා නේද? අර දියට මොනවදෝ විසිකරනවා''
- ''උදව් පිණිස දකිනු කැමැත්තෙමි එදා මෙන් අද ඒ වෙලාවට එතැන සිටිය මැනවි''
- ''පොත් මිටියක් තුරුළු කරන්, දෙනෝ දහක් සෙනග ගොඩේ''
- ශ්‍රී ලංකාවේ නැත්තේ මොනවාද? ඔබට සිතින් සිතාගත හැකි හැම ආශ්චර්යක්ම එහි ඇත්තේය.

1. වේලාසන කොක්කු ඇවිත්, විජයබා කොල්ලය, අකීකරු පුත්‍රයෙකුගේ ලෝකය, සක්වා ලිහිණි
2. සදා මෙලෙස පුර දෙරණේ, විජයබා කොල්ලය, අකීකරු පුත්‍රයෙකුගේ ලෝකය, වේලාසන කොක්කු ඇවිත්
3. සක්වා ලිහිණි, විජයබා කොල්ලය, සදා මෙලෙස පුර දෙරණේ, වේලාසන කොක්කු ඇවිත්
4. විජයබා කොල්ලය, සදා මෙලෙස පුර දෙරණේ, අකීකරු පුත්‍රයෙකුගේ ලෝකය, වේලාසන කොක්කු ඇවිත්

16. උක්ත නාම පද දෙකක් හා අනුක්ත නාම පද දෙකක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. තොප, අපි, මා, අප
2. ගැහැනිය, මිනිස්සු, වඩුවෝ, දියණියෝ
3. අපි, සේවකයෝ, තා, ඔවුන්
4. මා, ගුරුවරුන්, ග්‍රන්ථයන්, මව්වරුන්

17. ''සන්දේශයක් ගෙනෙන දූතයෙකු මෙන් පැමිණි ඒ හීය දෙස බැලූ නීලමනී කුමරිය ……''
ඉහත දැක්වූ පාඨයෙහි ඇතුළත් උපමේය වන්නේ කුමක්ද?
1. දූතයෙකු
2. හීය
3. සංදේශය
4. නීලමණී කුමරිය

18. <u>භාවික ගුණයෙන්</u> පිරිපුන් වචන යොදා ගැනීම සාහිත්‍යකරුවාගේ භාෂාවේ විශේෂ ලක්ෂණයකි.
ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ
1. ගැඹුරු අර්ථයෙන්
2. සැඟවුණු අර්ථයෙන්
3. හැඟීම් දනවීමේ ශක්තියෙන්
4. මතුපිට අර්ථයෙන්

19. නොගැළපෙන පද යුගලය අයත් යුගල පදය තෝරන්න.
1. දුව පැන
2. කර කියා
3. ජරමර
4. තළාපෙළා

20. ''සින්ධුපමාන වැව් තලා මතින් ඇදී'' මෙහි ''සින්ධුපමාන'' යන්නෙහි අර්ථය සහිත පිළිතුර තෝරන්න.
1. ගීතවත් හඬින් යුතු
2. ගීතයකට සමාන
3. සාගරය හා බැඳුණු
4. සාගරය හා සමාන

21. පහත දී ඇති පද යුගලවල අර්ථය වරදවා දී ඇති පදයක් සහිත වරණය තෝරන්න.

1. සොඬු - කම්මුල
නිරවුල් - පැසුණු කෙස්
2. උවම් - උපමා
සබවස - සත්‍ය වචන
3. සකලයෝ - කුරුල්ලෝ
බක්කම්මා - ලොකු අම්මා
4. උත්තීන් - කියමන්
පරිපෝෂිත - අනුන්ගෙන් පෝෂණය වන

22. රූපකයක් යෙදී ඇති කවි පදය තෝරන්න.

1. මාණික්‍යය සේ පොළෝ ගැබේ නිධාන වී
2. අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි දුවනවා
3. ගල් ගහන්නා වාගේ වතුර කැට වැටෙනවා
4. මව්ගුණය ඇති අය දරුවන් දිනිය යුතු වේ

23. දී ඇති අක්ෂර ගැළපීමෙන්, නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.

1. මකෑගුලල්ම
2. යගරාවි
3. මඩියබෝ
3. වජර්නාසආ

24. විරාම ලකුණු නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.

1. ''උඹලා ඔතන මොකද කවුද උඹලාට තොරොක්කෝ අල්ලන්න කිව්වේ?''
2. ''මං තවත් නම් පෙස්සම් ලියන්නේ නැහැ,'' යි ඔහු කීය.
3. ලෝකයේ හැම ජන කොට්ඨාසයකට ම තම රටට ආදරය පක්ෂපාතීභාවය දේශානුරාගය දනවන නිර්මාණ ඇත.
4. මේ ගොනා අහිනවද? ඔහු කම්කරුවන්ගෙන් ඇසුවේය.

- **25, 26, 27 ප්‍රශ්නවල දී ඇති කියමන්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළු සොයන්න.**

25. යමක් ක්‍රියාත්මක නොකොට කතාවට පමණක් සීමා කිරීම

1. හතර බීරි කතාව වගේ
2. මාළුවා නහින්නේ කට නිසාලු
2. කටින් බතල කොළ හිටවනවා වගේ
4. අටුව කඩා පුටුව හැදුවා වගේ

26. පිළිකුළෙන් හා නොසැලකිල්ලෙන් සැලකීම

1. උගුරට හොරා බේත් කන්නා වාගේ
2. එපා වාහෙට හොදි බෙදන්නා වාගේ
3. ආඳා මාළු ඉරටුවෙන් කන්නා වාගේ
4. ලෙඩ කපුටා වැල කනවා වාගේ

27. හේතුවක් නොමැතිව කිසිවක් සිදු නොවේ

1. ගඟෙන් දිය බී මුහුදට ආවඩන්නා සේ
2. අනේ කාලේ වනේ වාසේ
3. ගින්නක් නැතිව දුමක් නොනගී
4. යන්නෙ කොහෙද මල්ලෙ පොල්

28. සෑම අංගයන්ගෙන් සම්පූර්ණ වූ යන්නට දිය හැකි තනි පදයකි

1. සර්වපූර්ණ 2. සර්වාංගසම්පූර්ණ 3. සර්වතෝභද්‍ර 4. සර්වසාධාරණ

29. මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පදයක් යෙදී නැති පිළිතුර තෝරන්න.

1. මලවි - කුසුම්සර, කම්පසේ, මදරද, පන්සිළු
2. මයුර - මොනර, නිල්ගෙල, සිකි, පිල්බර
3. මිහිපල් - භූපති, නරනිඳු, මීපල්, නිරිඳු
4. සුරිඳු - ශක්‍ර, සක්දෙව්, සහසැස්, සුර රජ

- 30-33 දක්වා ප්‍රශ්නවල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදිව දැක්වෙන උත්තරය තෝරන්න.

30. ප.ව. 4.30 පමණ වන විට සභා තුමු විසිර ...........

1. ගියහ 2. යයි 3. ගියේය 4. ගියාය

31. වනජීවී නිලධාරීන් විසින් සත්තු ආරක්ෂා කරනු ...........

1. ලැබුවේය 2. ලබයි 3. ලබති 4. ලදි

32. කම්කරුවෝ ................ විශිෂ්ට සම්මාන හිමිකර ගත්හ.

1. පස් දෙනෙකු
2. පස් දෙනෙක්
3. දෙදෙනකු
4. එක් අයෙකු

33. …………… වේදිකාව මත මනහර රැගුමක් ඉදිරිපත් කරනු ඇත.
1. නළුවෝ 2. නළුවන් 3. නළු නිළියෝ 4. නළුවෝද නිළියෝද

34. කර්මකාරක හා කර්තෘකාරක වාක්‍ය සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,
1. කර්මකාරක වාක්‍යයක ක්‍රියාව උක්ත කර්තෘට අනුව තැබේ.
2. කර්තෘකාරක වාක්‍යයක කර්තෘ අනුක්තව තැබේ.
3. කර්මකාරක වාක්‍යයක ක්‍රියා උක්ත වූ කර්මයට අනුව තිබිය යුතුය.
4. කර්තෘකාරක වාක්‍යයක කර්මකාරක ක්‍රියාව යෙදේ.

35. වැරදි අදහස සහිත වරණය තෝරන්න.
1. ''ඇය'' යන්නෙහි උක්තය ''ඕ'' යන්නයි
2. ඔවුහු යන පදය සර්වනාමයක් ලෙස ගැනෙන්නේ නැත.
3. බිසවු තුමු යන්න ගෞරවාර්ථ බහුවචන නාම පදයකි
4. ය, ර, ල, ව යන අක්ෂර අන්තඃස්ථ අක්ෂර ලෙස හැඳින්වේ.

36. ''සිංහලයා ඉතා විනීතය, ආගන්තුක සත්කාරයෙහි තත්පරය'' මෙසේ ප්‍රකාශ කරන ලද්දේ,
1. ජෝන් ඩොයිලි 2. රොබට් නොක්ස් 3. ලෙනාඩ් වුල්ෆ් 4. ෆෙඩ්රික් නෝර්ත්

37. නිවැරදිව පද බෙදා ඇති වාක්‍ය තෝරන්න.
1. රමණීය අරුත්දැන වෙනපරිදි කරන භාෂාවක නිර්මාණය කවියයි.
2. පැරණි ජීවනෝපායන් බොහෝ විට ආගමික පරිසරය අනුව සකස් වී ඇත.
3. භාෂාව මාධ්‍යකොටගනිමින් සම්පාදනය වන ලිඛිත මෙන් ම අලිඛිත ද සියලු දෑ සාහිත්‍ය යනුවෙන් හැඳින්විය හැකි ය.
4. සුනේත්‍රාගේහඩින් සේනාධීරගේ සිතෙහි ඇති වන ප්‍රහර්ෂය අවට පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කිරීමෙන් කුළු ගන්වයි.

38. සාවද්‍ය කියමන තෝරන්න.
1. සිංහල අක්ෂර මාලාවට අලුතින් එක් කොට ඇති ''ෆ'' ශබ්දය අඝෝෂ අකුරකි.
2. කර්මකාරක වාක්‍යයක කර්මය උක්ත වී කර්තෘ අනුක්ත වේ.
3. සිංහල අක්ෂර මාලාවේ අක්ෂර 60ක් ඇති අතර එය ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.
4. අක්ෂර උපදින ස්ථාන අනුව සිංහල අක්ෂර වර්ග කළ නොහැකිය.

39. පහත සඳහන් කවියෙහි අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

සිව් සඟරාවතින්, දස රජ දමින් බැඳී
සව් ලෝ සතට කුලුණින් සව් ඉසුරු දීදී
දෙව් රජවරුන් වැනි මහ රජවරුන් රැඳී
දෙව් ලෝ සිරිය පෙර අප සිරිලකෙහි ලදී

1. සතර සංග්‍රහ වස්තු, දසරාජ ධර්මයෙන් බැඳුණු සියලු ලෝ වැසියන්ට කරුණාවෙන් සම්පත් ලබාදෙන දෙව්වරුන් වැනි රජවරු ශ්‍රී ලංකාව දෙව්ලොවක් කළහ.
2. පෙර රජවරු සතර සංග්‍රහ වස්තු, දසරාජ ධර්මයෙන් බැඳී සියලු රට වැසියන්ට කරුණාවෙන් සම්පත් ලබා දී සිරිලක දෙව්ලොවක් කළහ.
3. දෙව් රජවරුන් වැනි රජවරු සිරිලක දෙව්ලොවක් කළේ සතර සංග්‍රහ වස්තුවලින් කරුණාවෙන් සියලු සැප සම්පත් ලබා දෙමිනි.
4. සතර සංග්‍රහ වස්තුවලින් දසරාජ ධර්මයෙන් යුතු රජවරු ලක් වැසියනට සියලු සැප සම්පත් දී සිරිලක දෙව් ලොවක් කළහ.

40. එස්. මහින්ද හිමියෝ ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ පරමාභිලාෂයෙන් යුතුව පැනෙන් සටන් කළහ. මෙහි අදහස වඩාත් ප්‍රකාශ වන පිළිතුර තෝරන්න.
1. එස්. මහින්ද හිමියෝ පරාධීනත්වයෙන් මුදවා ගැනීම සඳහා මහත් බලාපොරොත්තුවෙන් පැනෙන් සටන් කළහ.
2. එස්. මහින්ද හිමියෝ ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ උතුම් පරමාර්ථයෙන් පැනෙන් සටන් කළ අයෙකි.
3. උතුම් වූ එස්. මහින්ද හිමියෝ ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමට පැනෙන් සටන් කළහ.
4. මහින්ද හිමියන්ගේ එකම බලාපොරොත්තුව වූයේ පැනෙන් සටන් කර ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමයි.

(ලකුණු 40)

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 10 ශ්‍රේණිය

**සිංහල භාෂාව හා සාහිත්‍යය II** **කාලය :** පැය 2

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

1. i සිට x තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල හෝඩියේ ඇතුළත්
(අ) නාසික්‍ය අක්ෂරයක් (ආ) හ්‍රස්ව අක්ෂරයක් බැගින් ලියන්න.

ii. තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය සඳහන් කරන්න.
(අ) මම පුස්තකාලයට **ගොස්** පොතක් කියවීමි.
(ආ) දේශකයෙකු දේශනය **පවත්වද්දී** ශ්‍රාවකයෝ අත්පොළසන් දුන්හ.

iii. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කොට ලියන්න.
පසුගිය වසරේ සහල් නිශ්පාදනය කොතරම් ඉහළ ගියේ ද යත් එයට සරිලන වෙලඳපොළ සොයා ගැනීම දුෂ්කර විය.

iv. පහත දැක්වෙන පදවල විරුද්ධ පදය බැගින් ලියන්න.
(අ) ආගන්තුක (ආ) දුලබ

v. පහත දැක්වෙන පදවල ප්‍රකෘතිය ලියන්න.
(අ) මල (ආ) දූරිය

vi. පහත සඳහන් වාක්‍ය සදොස්ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) දුම්රිය සේවකයෝ වැඩ වර්ජනය කරති' යි මගිහු සැක පහළ කළහ.
(ආ) දක්ෂ ශිෂ්‍යාවක් වන්නේ කෙසේද?

vii. පහත පදවල අනුක්ත බහු වචන පදය ලියන්න.
(අ) ගුරුවරයෙක් (ආ) ගොවියා

viii. තනි පදය ලියන්න.
(අ) නිතර නිතර අභ්‍යාසයේ යෙදීම (ආ) අපූරු වස්තුවක් නිර්මාණය කිරීමේ හැකියාව

ix. පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාරයන් සඳහා පොදු ව්‍යවහාර ලියන්න.
(අ) සකලයා (ආ) ඔයනවා

x. පහත සඳහන් වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) වළ (ආ) වල

(ලකුණු 20)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) වර්තමානය වන විට දිනකට රිය අනතුරුවලින් සිදුවන මරණ සංඛ්‍යාව අටක් පමණ වන බව හෙළිදරව් වී ඇත. මාර්ග නීති නොපිළි පැදීම, අධික වේගය, බීමත් කමින් රිය පැදවීම, මාර්ග පටු වීම, අධික වාහන ප්‍රමාණය, රියදුරන් හට නින්ද යාම ආදිය තුළින් රිය අනතුරු සිදු වී මිය යෑම්, සදාකාලික පූර්ණ අකර්මන්‍යතාවයට පත්වීම් බහුලය. ඒ තුළින් වැඩි වශයෙන්ම යතුරු පැදි භාවිතා කරන්නන් මිය යන අතර, ඔවුහු තරුණයෝ වෙති. රටකට ජීවනාලිය බඳු තරුණයන් මිය යාම රටට මහත් පාඩුවකි. පවුල් පවා අසරණ තත්ත්වයට පත් වෙයි. එමෙන්ම රජයට ප්‍රතිකාර සඳහා වැඩි බරක් දැරීමටද සිදුවී ඇත.

(ආ) රටක පුරවැසියන්ගේ නිරෝගිකම එම රටේ සංවර්ධනයේ දී ඉතා වැදගත් වේ. ශ්‍රී ලාංකික ජන සමාජය මේ වන විට විවිධ බෝ නොවන රෝගීන්ගෙන් බහුල රටක් බවට පත්වී ඇත. දියවැඩියාව, පිළිකා, හෘදයාබාධ, අධික රුධිර පීඩනය ආදි බෝ නොවන රෝගයන් සඳහා ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව ඉතා ඉහළය. මේ සම්බන්ධව සෞඛ්‍ය විශේෂඥයෝ විවිධ මත පළ කරති. ව්‍යායාම ප්‍රමාණවත් නොවීම, වස විසෙන් යුත් ආහාර ගැනීම අධික ලෙස  ආහාර ගැනීම, අවිධිමත් ලෙස ආහාර ගැනීම, මානසික ආතතිය හා ජානමය වශයෙන් බලපාන විවිධ හේතු ගෙන හැර දක්වයි.

(ඉ) ජංගම දුරකථන, රූපවාහිනිය, අන්තර්ජාලය, පරිගණක ආදියේ ඇතැම් බලපෑම් නිසා ද පාසල් ළමයි වෙතින්, කියවීමේ පුරුද්ද ටිකෙන් ටික ඈත් වන බවක් පෙනේ. ළමයින් තුළ කියවීමේ පුරුද්ද ඇති කිරීම පාසලටත්, ගෙදරටත්, රජයටත්, පැවරෙන විශාල වගකීමකි. කියවීමේ පුරුද්ද කුඩා කල සිටම ඇති කළ යුත්තේ එය සාර්ථක ජීවිතයකට ජය මග වන බැවිනි. කියවීම මිනිසෙකු සම්පූර්ණ කරයි. යන කියමන අප අනිවාර්යෙන්ම වැළඳ ගත යුතුය.

(ඊ) මිනිසාගේ වැඩ පහසු කරගැනීම අනාදිමත් කාලයක සිට විවිධ සොයා ගැනීම් හා නිපදවීම් කිරීමට මිනිසා පෙළඹිණි. වාෂ්ප යන්ත්‍රය සොයා ගැනීමත් සමග කාර්මික විප්ලවය ඇරඹී වර්තමානය දක්වා ආ ගමනේ මිනිසා සොබාදහමට අභියෝග කරමින් විවිධ ජයග්‍රහණ ලබා ගැනීමට උත්සුක වෙමින් සිටියි. කාර්මික විප්ලවයත් සමග ඇති වූ වායු දූෂණය තුළින් හරිතාගාර වායු පරිසරයට මුදා හැරීම, වනාන්තර විනාශය ආදිය නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ ගොස් නාය යෑම, භූමි කම්පා, සුළි සුළං, සුනාමි, ළැව්ගිනි, ගංවතුර, ගිනි කඳු පිපිරීම ආදි කාලගුණ විපර්යාසයන් නිසා නොනවතින අරගලයකට මුහුණ දීම ලෝකවාසීන්ට සිදුවී ඇත.

(ලකුණු 25)

3. පහත දැක්වෙන ඡේදය වචන 50-60 අතර වන සේ සාරංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

දරුවා යනු රටක ජාතික සම්පතකි. එම සම්පත් රටට ඵලදායී ලෙස සකසා ගැනීමේ වගකීම මවගේත් පියාගේත් අත රැඳී පවතී. දරුවෙකුගේ පූර්ණ සංවර්ධනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. ළමයාගේ මානසික සංවර්ධනයට බලපාන ප්‍රධාන හේතු සාධකය ලෙස අධ්‍යාපනය දැක්විය හැක. දරුවෙකු අධ්‍යාපනය ලැබීම අරඹනු ලබන්නේ මවුකුස තුළදීමය.

මව්කුසින් බිහි වූ දරුවෙකු අවුරුදු 1 සිට අවුරුදු 5 සම්පූර්ණ වන විට ඔහුගේ මොළයේ වර්ධනයෙන් සියයට අනූවක් වර්ධනය වී අවසන්ය. මොළයේ ශීඝ්‍ර වර්ධනයක් සිදුවන මුල් වසර පහ තුළදී ඊට රුකුල් ලබාදීම මව්පිය, වැඩිහිටි සැමගේ වගකීමකි. ඒ සඳහා අවශ්‍ය විවිධ ඉගෙනුම් අවස්ථා නිවසේදීම සලසා දීම කළ හැකිය. ආහාර ගැනීම, මුහුණ සේදීම, ඇඳුම් ඇඳීම වැනි නිවස ආශ්‍රිත සෑම ක්‍රියාකාරකමක් ආශ්‍රයෙන්ම දරුවාට අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව සලසා දීමට හැකියාව තිබේ. පිපීගෙන එන මල් පොහොට්ටුවක් විකසිත වෙමින් පරිසරය සුවඳ කරන්නා සේ දරුවාගේ මානසික සංවර්ධනය තුළින් නීරෝගී කායික සංවර්ධනයක් ද ගොඩනැගෙනු ඇත. නිවසේ කටයුතු සඳහා දරුවා හවුල් කරගැනීම තුළින් දරුවාගේ සංවර්ධනයට අවශ්‍ය සාධක සලසා දීමට මව්පියන්, වැඩිහිටියන් ක්‍රියා කළ යුතුය. දරුවා නිවසින් පෙර පාසලට ද, පෙර පාසලින් විධිමත් පාසලට ද යොමු වීමේ දී නිවසින් ලබාගත් අත්දැකීම් හා දැනුම ඔවුන්ගේ ඉදිරි දිවියට මහෝපකාරී වේ.

(ලකුණු 10)

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

සාහිත්‍යය පරාර්ථය උදෙසාම කැපවූවකි. සාහිත්‍යකරුවා තම අදහස් තමා තුළ ම තබා නොගෙන අන්‍යයන් වෙත පමුණුවන්නේ එහෙයිනි. මේ කාර්යයෙහි ලා ඔහු සතුව පවතින සියුම් බව හා පරිණත බව මත සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලීත්වය පිවිසේ. පාඨකයා තමන් සතු රුචිය හෝ පළපුරුද්ද හෝ අනුව එය කියවයි. විචාරකයා කෘතියෙහි අන්තර්ගතය පිළිබඳ විමසා බලයි. එහිදී ඊට අයත් විෂය ක්ෂේත්‍රය, භාෂාව, ශෛලිය හා ආකෘතිය වැනි ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. විචාර කාර්යයේ දී මෙකී ලක්ෂණ පිළිබඳව පමණක් නොව අත්දැකීමෙන් ගොඩනගා ගත් බහුශ්‍රැතභාවයි. බහුශ්‍රැතභාවයෙන් හිස් වූ විචාරකයෙකුට කෘතියක් අවතක්සේරු කිරීමත්, අධිතක්සේරු කිරීමත් ඉතා පහසුය. මේ ක්‍රම දෙකෙන්ම කෘතියට සාධාරණයක් ඉටු නොවීය.

i. සාහිත්‍යය පරාර්ථය උදෙසා කැපවූවක් බව ලේඛකයා පවසන්නේ කුමක් නිසාද?

ii. සාහිත්‍යකරණය උදෙසා, දායකත්වය සපයන පුද්ගලයෝ කවරහුද?

iii. මෙම ඡේදයේ සඳහන් පරිදි සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලිත්වය පිවිසෙන්නේ ලේඛකයා සතු කවර ගුණාංග නිසාද?

iv. ලේඛකයා පවසන පරිදි කෘතියක් විචාරයට ලක්කිරීමේ දී විශේෂ අවධානය යොමු කෙරෙන කරුණු මොනවාද?

v. කෘතියක් අවතක්සේරු කිරීමත් අධිතක්සේරු කිරීමත් සිදුවන්නේ කෙබඳු විචාරකයකු අතින්ද?

(ලකුණු 10)

5. රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටවිය යුතු බව ද ඊට සුදුසු ගොඩනැගිල්ලක් ඉදි කළ යුතු බව ද මොණරවිල දීප්ති යෞවන සමාජයේ මාසික රැස්වීමේ දී තීරණය කෙරිණි. යෞවන සමාජයේ ලේකම්වන කුමාර වැලිවත්ත ඔබ යැයි සිතා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටවීමෙන් ප්‍රදේශ තරුණ තරුණියන්ට සිදුවන සේවය පිළිබඳව අවධාරණය කරමින් දැනට ප්‍රජාශාලාව පවතින භූමියේ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා අවසර ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

(මේ සඳහා වචන 100ක් ප්‍රමාණවත්ය)

නැතහොත්

පදවිය,පුවත්පත් විශේෂාංග වාර්තාකරුවෙකු වන සුනිල් බාලසූරිය පස් පෙරළීමේ අලුත් යන්ත්‍රයක් නිපද වූ තරුණයෙකු පිළිබඳ විස්තර ඔහුගේ සටහන් පොතේ තබාගන්නේ මෙසේ ය.

- සම්පූර්ණ යන්ත්‍රයට වැය වූයේ රු.1,500.00
- ගරාජයේ ඉවත දමන ලද කෑලි යොදා ගත් බව
- තනි කෙනෙකුට පාවිච්චි කළ හැකිය
- අක්කරයකට භූමිතෙල් ලීටරයකි.
- සාමාන්‍ය පෙළ සමත් ,කැළුම් ජයසූරිය
- කුරුණෑගල, ජයගම
- යන්ත්‍රය තවත් දියුණු කර වෙළෙඳපොළට යවන බව ඔහු කියයි.

ඉහත තොරතුරු පදනම් කොට ගෙන වචන 100 ක පමණ පුවත්පත් විශේෂාංග ලිපියක් සකසන්න.

(ලකුණු 15)

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 10 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය III **කාලය :** පැය 2

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.**

**i සිට x තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

01. i. (අ.) සිංහල ජාතක පොත රචනා කිරීමට මූලාශ්‍ර වූ ග්‍රන්ථය කුමක්ද?

(ආ.) ජාතක පොත ඇසුරින් රචිත ගී කාව්‍යය දෙකක් නම් කරන්න.

ii. (අ) ගුත්තිල කාව්‍යය රචනා කළ කතුවරයා කවුද?

(ආ) ගුත්තිල කාව්‍යය රචනා කිරීම සඳහා පදනම් වූ ජාතක කතාව කුමක්ද?

iii. දිය දිය ගොස පල කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි

(අ) ඉතිරි කවි පද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) මෙහි ඇති කාව්‍යාලංකාරයක් ලියන්න.

iv. (අ) බැද්දේගම රචනා කිරීමට මුල් වූ ඉංග්‍රීසි නවකතාව කුමක්ද?

(ආ) එය රචනා කළ කතුවරයා කවුද?

v. "මිනිහා අනුමානයක් නැහැ මැරෙන්නම ඇති"

(අ) මේ ප්‍රකාශය කළේ කවුද?

(ආ) ''මිනිහා'' යනුවෙන් සඳහන් කරන්නේ කවුරුන් පිළිබඳව ද?

vi. ''හානා හීය පානා අඬ හැරෙන් දැනේ'' පාඩමේ ඇතුළත්

(අ) ජන කවි හැඳින්වෙන්නේ කෙසේද?

(ආ) ජනකවි පිළිබඳ දිගු ඉතිහාසයක් ඇති කරන ග්‍රන්ථය කුමක්ද?

vii. (අ) උම්මග්ග ජාතකය රචනා වී ඇත්තේ කිනම් යුගයකද?

(ආ) ජාතක කතා වලට නියමිත ආකෘතිය කුමක්ද?

viii අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා

(අ) මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) මෙම කවියේ සඳහන් ආකාරයට දියට දැමුවේ කුමක්ද?

ix (අ) ගුත්තිල කාව්‍ය රචනා කළ යුගය කුමක්ද?

(ආ) පන්සිය පනස් ජාතක පොතේ ඇති ජාතක කථා ගණන කීයද?

x (අ) ''තමන්ගේ තරම දැනගෙන කල් හරිනු'' යන්නට ගැළපෙන පිරුළක් ලියන්න.

(ආ) බැද්දේගම නවකතාව සඳහා පාදක වූ දිස්ත්‍රික්කය කුමක්ද?

(ලකුණු 2x10-20)

**2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.**

i. ''මගුල් උයන **නඳුන් උයනක්** සේ සරසා දහස් ගණන් කුඩම් වල රා පුරා තබ්බා **අනේක ප්‍රකාර** මසුවුළු ඒ ඒ ස්ථානයෙහි වලන් පුරා රැස් කොට තබව''

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම ප්‍රකාශයෙහි අර්ථය සරල බසින් ලියන්න.

ii. **පන්සිළු** වීණා නද පසු බැස්වූ
මන් පිනවන වේණ නදයෙන් තොස්වූ
නන් **දනකැන්** දුටුවද බිය සිස්වූ
මින් රළ වූත් ගං වෙරළට රැස්වූ

(අ) මෙම පද්‍යයෙන් කියවෙන අවස්ථාව කුමක්ද?

(ආ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

iii. ........................................................
රසින් සුර සැව් **සුවහස්**
සුරන් සහ **සහසස්**
........................................................

(අ) මෙම කවියේ ඉරි ඇඳි පදවල තේරුම ලියන්න.

(ආ) හිස් පද දෙක සම්පූර්ණ කරන්න.

iv. ගසට කෙටුව ගස මුල පැයුමෙන් දැනේ
මිනිහා **නොමිනිහා** යන කඩිසරෙන් දැනේ
අමුතු බත් දීම අත ඇල්ලුවොත් දැනේ
හානා හීය පානා **අඬහැරෙන්** දැනේ

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) කවියේ අදහස ලියන්න.

v. ''කැලැ ජීවිතයෙහි ලකුණු ඇගේ ශරීරයෙහි ඇඳී තිබුණේය. නිරිත දිග තද සුළඟට ඇඹර වී ඇටුවන් බැහී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය නැමී ඇඹරී තිබිණි.''

(අ) මෙහි සඳහන් උපමාව ලියන්න.

(ආ) ''කැලෑ ජීවිතයෙහි ලකුණු ඇගේ ශරීරයෙහි ඇඳි තිබුණේය'' යන පාඨයේ අදහස ලියන්න.

(ල 4 x 5 – 20)

**3, 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

03. i. උපමා භාවිතය ii. අනුප්‍රාසවත් වචන මාලාවක් භාවිත කිරීම

හේතුවෙන් ''උම්මග්ග ජාතකය'' පාඨකයා අතර ජනප්‍රිය විය. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

නැතහොත්

ii. (i) සරල භාෂාවක් භාවිතා කිරීම ii. එළිසමය ආරක්ෂා කිරීම

නිසා ගුත්තිල කාව්‍යය සාර්ථක විය. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

(ලකුණු 15)

04. i. පුංචි මැණිකා

ii. කර්ලිනාහාමි යන චරිත තුළින් අවිනිශ්චිත අඳුරු අනාගතය විදහාපායි.

බැද්දේගම නවකතාවේ නිර්දිෂ්ට පරිච්ඡේදය ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විමසීමට ලක් කරන්න.

නැතහොත්

දැනමුතුකමට කියන කවි වලින් ගැමියන් සතු

i. සංයමයත්

ii. අව්‍යාජ බවත්

ගම්‍යමාන වන අයුරු ''හානා හීය පාන අඬහැරෙන් දැනේ'' යන උපදේශ කවි පෙළින් යෝග්‍ය නිදසුන් 2 බැගින් උපුටා පෙන්වා දෙන්න.

(ලකුණු 15)

**05, 06, 07 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

05. ගැමි ජනයාගේ සමාජමය අත්දැකීම් දේශ කාල භේදයෙන් තොරව ජීවිත හැඩගස්වා ගැනීමට ඉවහල් වේ. හානාහීය පානා අඬ හැරෙන් දූනේ පද්‍ය පන්තියේ පද්‍ය තුනක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 10)

06. ''ගුත්තිල කාව්‍යය අර්ථ රසයෙන් හා ශබ්ද රසයෙන් පරිපූර්ණ වූ කාව්‍යයකි'' නිදසුන් තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

07. බැද්දේගම නවකතාවේ බස් වහර අභාවයට යන ගැමියන්ගේ කටුක ජීවිතය හා ගම පිළිබඳ මනා චිත්ත රූපයක් මැවීමට සමත් වී ඇත. නිදසුන් තුනක් ඇසුරින් විමසන්න.

(ලකුණු 10)